සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

8890

7-11-2016

Learning Resource Center
R
College

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 1 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි.

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලදී 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න

iv. 1 ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.

---

1. ගැලවීමේ ඉතිහාසයේ පරමාර්ථය වන්නේ,
   i. දැනුම වර්ධනය කිරීම
   ii. අත්දැකීම් වර්ධනය කිරීම
   iii. දේව සබඳතා වර්ධනය කිරීම
   iv. දේව විශ්වාසය වර්ධනය කිරීම

2. බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ සමාජයීය හා ආගමික ප්‍රතිස්ථාපනය පිළිබඳ කරුණු සඳහන් වන පොත් වන්නේ,
   i. රූත් කථාව හා එස්තර් ය.
   ii. රූත් කථාව හා නෙහෙමියා ය.
   iii. එස්තර් හා නෙහෙමියා ය.
   iv. එස්තර් හා එස්රා ය.

3. අපොස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ සැකැස්ම වන්නේ,
   A. ජෙරුසලමෙහි සාක්ෂි දැරීම
   B. ගලාතියේ සාක්ෂි දැරීම
   C. ජුදයේ හා සමාරියේ සාක්ෂි දැරීම
   D. රෝමයේ සාක්ෂි දැරීම
   මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
   i. A හා C ය.
   ii. A හා B ය.
   iii. A,B හා C ය.
   iv. A,C හා D ය.

4. අපෝස්තලික යුගයේ දී ශුද්ධ වූ සභාවට මහඟු සේවයක් කළ විශිෂ්ට පුද්ගලයකු ලෙස ............හැඳින්විය හැකිය. හිස්තැනට පිළිතුර වන්නේ,
   i. ශුද්ධ වූ ස්තේපන් තුමා
   ii. ශුද්ධ වූ පාවුලු තුමා
   iii. ශුද්ධ වූ තෝමස් තුමා
   iv. ශුද්ධ වූ ලූක් තුමා

5. එළිදරව් සාහිත්‍යයේ මෙම වර්ණ සංකේත වලට අදාළ හිස් තැන් වලට නිවැරදි වන්නේ,
   1. සුදු................
   2. කළු.............
   3. සුදු මැළි..................
   i. මරණය/සාගතය/ විශ්වය.
   ii. ජයග්‍රහණය/ සාගතය/ මරණය
   iii. විශ්වය/පූර්ණත්වය/ සාගතය.
   iv. ජයග්‍රහණය/ඉශ්‍රායෙලය/යුද්ධය

6. ගිනිගත් නොදැවෙන පඳුර මගින් සංකේතවත් කරන්නේ,
   i. මෝසෙස් තුමාගේ කැඳවීම ය
   ii. දෙවියන් වහන්සේගේ බලවත් බවය.
   iii. දෙවියන් වහන්සේගේ වැඩ සිටීම ය
   iv. මෝසෙස් තුමාගේ දුර්වලතාවය.

7. ප්‍රඥාව සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය **හොක්මාය**. මෙහි ඉරි ඇඳි පදයෙහි අර්ථය වන්නේ,
   i. ශුද්ධවන්තව හා පිරිසිදුව ජීවත්වීමේ හැකියාව
   ii. පූර්ණව හා ශුද්ධවන්තව ජීවත්වීමේ හැකියාව
   iii. ශුද්ධවන්තව හා ධර්මිෂ්ඨව ජීවත්වීමේ හැකියාව
   iv. සාර්ථකව හා ධර්මිෂ්ඨ ජීවත්වීමේ හැකියාව

8. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ වන්නේ,
   i. ජෝබ්/ ප්‍රේම ගී/ ගීතාවලිය
   ii. හිතෝපදේශය/ ප්‍රඥාව/විලාප ගී
   iii. දානියල්/ සිරාක්/ධර්මදේශකයා
   iv. ප්‍රඥාව/ වීරාවලිය/ එස්තර්



41

9. "නව අහසට හා නව පොළොවට ඇතුළු වීමට සුදුස්සන් වීමට නම්,

A. පාපි ක්‍රියා අතහැර යාච්ඤා කිරීම
B. ප්‍රේම කරන අයට පමණක් ප්‍රේම කිරීම
C. පරිත්‍යාගයෙන් ජීවත් වීම
D. දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම

ඉහත පිළිතුරු වලින් නිවැරදි පිළිතුර වන්නේ,

i. A හා D ය. ii. A ,B හා D ය. iii. A,C හා D ය. iv. C හා D ය.

10. "ජේසුස් වහන්ස ඔබ රාජශ්‍රීයෙන් වඩිනා කළ මා සිහිකළ මැනව" මෙසේ පැවසුවේ

i. අරමතියේ ජෝසෙප් ය.
ii. ජේසුස් වහන්සේ දෙපසින් සිටි එක් වරදකරුවෙක් ය.
iii. මග්දලාහි මරියා ය.
iv. පිලාත් ආණ්ඩුකාරයා ය.

11. ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා වන්නේ,

i. ශුද්ධ වූ ස්තේපන් තුමා ය.
ii. ශුද්ධ වූ මහා ජාකොබ් තුමා ය.
iii. ශුද්ධ වූ සන්තියාගෝ මුනිතුමා ය.
iv. ශුද්ධ වූ පාවුලු තුමා ය.

12. ශුද්ධ වූ පාවුලු තුමා රෝමයේ නිවාස අඩස්සියේ සිටි කාලයේ සිදු කළේ,


i. රෝම අධිරාජ්‍යයාට එරෙහිව කථා කිරීම
ii. ශුභ අස්න අසන්න පැමිණි අය බෞතිස්ම කිරීම
iii. වැරදි මාර්ගයේ යන්නන්ව නිවැරදි මාර්ගයට යොමු කිරීම
iv. ශුභ අස්න නොඅසාසිටි රෝම ජනතාවට ධර්මය දේශනා කිරීම

13. 2001 පෙබරවාරි 21 වන දින ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා විසින් කාදිනල් තනතුරට පත් කළේ,

i. අති උතුම් ෆ්‍රන්සිස් ශුද්ධෝත්තම පියතුමාව ය.
ii. අති උතුම් හයවන පාවුලු ශුද්ධෝත්තම පියතුමාව ය.
iii. අති උතුම් දහවන පියුස් ශුද්ධෝත්තම පියතුමාව ය.
iv. අති අතුම් දොළොස්වන පියුස් ශුද්ධෝත්තම පියතුමාව ය.

14. ශුද්ධ වූ පාවුලු තුමා සමග දෙවන ධර්ම දූත ගමනට සහභාගි වුයේ,

i. බර්ණබස්තුමා හා ජොහන් මාක් තුමා
ii. සීලස් හා බර්ණබස් තුමා
iii. තිමෝතියස් හා ජොහන් මාක් තුමා
iv. සීලස් හා ලූක් තුමා

15.



ඉහත හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

i. දේව රාජ්‍යයේ ලක්ෂණ
ii. ශුද්ධ වූ සභාවේ ලක්ෂණ
iii. මුල් කිතුනු සභාවේ ලක්ෂණ
iv. එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ


16. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ අඩංගු වන්නේ,

A. භෝජනයක් B. යාගයක් C. මන්නා භෝජනය D. ස්තුති කිරීමක්

මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

i. A,C හා D ය
ii. A හා C ය
iii. A, B හා D ය
iv. A හා D ය

17. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග වන්නේ,



ඉහත හිස්තැන් වලට සුදුසු පිළිතුරු වන්නේ,

i. පාස්කු බැටළුවා/ නුමුහුන් රොටි/ තිත්තපලා/ මිදියුෂ
ii. පූප/මිදියුෂ/තිත්තපලා/තෙල්
iii. බැටළුවා/මිදියුෂ/පූප/තිත්තපලා
iv. ගවයන්/කුරුල්ලන්/ ධාන්‍ය/තෙල්

18. උන් වහන්සේ එළුවන්ගේත්,..........ලෙයින් නොව තමන්ගේ ම ලෙයින් අප උදෙසා........ විමුක්තිය ලබා සදහට ම එක වරක් ශුද්ධවස්ථානයට ඇතුළු වූ සේක.
මෙහි හිස්තැන් පිළිවෙලින් පිරවීමට සුදුසු වන්නේ,

i. බැටළුවන්ගේත්/ස්වර්ගයේ
ii. ගවයින්ගේත්/ජීවිතයේ
iii. වස්සන්ගේත්/ සදාතන
iv. කුළුදුලන්ගේත්/මරණයේ

19. ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා භාග්‍යවරයට හා ශුද්ධවරයට ඔසවන ලද්දේ,

A. හයවන පාවුලු ශුද්ධෝත්තම පියතුමා
B. දහසය වන බෙනඩික් ශුද්ධෝතතම පියතුමා
C. ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා
D. දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා

මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

i. C හා D ය. ii B හා C ය. iii. A හා Bය. iv. A හා D ය.

20. ජේසුස් වහන්සේ ප්‍රේමයේ පනත ඉදිරිපත් කළේ,

i. පව්කාර ස්ත්‍රියට සමාව දුන් අවස්ථාවේ ය.
ii. අන්තිම රාත්‍රීභෝජනයේ පාද දෝවනයෙන් පසුව ය.
iii. ශ්‍රාවකයින් සේවය සඳහා පිටත් කර හරින අවස්ථාවේදී ය.
iv. සකේවුස්ගේ නිවසේ දී ය.

21. 1985 ඒඩ්ස් රෝගීන් සඳහා පළමු නිවහන නිව්යෝර්ක් නගරයේ විවෘත කළේ,

i. කුඩා තෙරේසා කන්‍යාව
ii. ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා
iii. භාග්‍යවත් තෙරේසා මව්තුමිය
iv. ගරු මයිකල් රුද්‍රිගු පියතුමා

22. තමාටම තම ගැලවීම ලබා ගත හැකි බව හා සිත් හැරීමක් නැතිව ගැලවීම ලබා ගත හැකි බව බලාපොරොත්තු වීම,

i. ඉච්ඡාභංගත්වය යි. ii. අනුමානය යි. iii. පශ්චාත්තාපය යි. iv. උඩගුව යි.

23. පළමු දේව පනතට විරුද්ධ ක්‍රියාවකි.

i. කිතුනුවකු ලෙස කිතුනුකමට සාක්ෂි නොදැරීම
ii.එදිනෙදා සිදුවීම් වලදී දෙවියන් වහන්සේට දොස් කීම
iii. ශුද්ධ වූ දේ හා දේව වචනය අගෞරව ලෙස භාවිතා කිරීම
iv. ධනය, බලය, කීර්තිය පසු පස හඹා යාම

24. "දරුවෙනි සියලු කාරණාවල දී දෙමාපියන්ට කීකරු වන්න......................" මෙහි හිස්තැනට ගැලපෙන පිළිතුර වන්නේ,

i. මන්ද ඔබ එසේ කිරීම සමිඳාණන් වහන්සේට ප්‍රීතියකි.
ii. මවගේ උපදෙස් ඉවත නොදමන්න.
iii. මව විදි ප්‍රසව වේදනාව කිසි දිනක අමතක නොකරන්න.
iv. ඔබේ මුළු සිතින් ඔබේ දෙමාපින්ට ගෞරව කරන්න.

25. "ඔබගේ කඩුව කොපුවේ දමන්න. කඩු ගන්නා සියල්ලෝම කඩුවෙන්ම නසිති" මෙසේ පැවසුවේ,

i. ශුද්ධ වූ පේදුරු තුමා ය.
ii. ජේසුස් වහන්සේ ය
iii. ශුද්ධ වූ පාවුලු තුමා ය.
iv. අරමතියේ ජෝසෙප් ය

26. පස්වන දේව පනතට විරුද්ධ ක්‍රියා නම්,

A. පරිසරය දූෂණය කිරීම
B. සාමය වෙනුවෙන් ඉදිරිපත් නොවීම
C. පමණ ඉක්මවා තෙල් සීනි ආහාර ගැනීම
D. නම් පටබැඳීම හා උසුළු විසුළු කිරීම

i. A හා B ය. ii. B හා D ය. iii. A,C හා D ය. iv. B,C හා D ය.

27. ජෝසෙප් පොතිපාර්ගේ බිරිඳට එකඟ වූයේ නම් කඩවන දේව පණත් වන්නේ,

i. හත්වන හා නවවන දේව පනත
ii. හයවන හා අටවන දේව පනත
iii. පස්වන හා හයවන දේව පනත
iv. හයවන හා නවවන දේව පනත

28. සොරකම් කළ අය තවත් සොරකම් නොකරන්න. ඒ වෙනුවට...............උපකාර කළ හැකි වනසේ වෙහෙස මහන්සිය දරා............වැඩ කරත්වා. මෙහි හිස්තැන්වලට සුදුසු පිළිතුර වන්නේ,

i. දුගීන්ට/ අවංකව ii. පෝසතුන්ට/උපරිම iii. ජනතාවට/වංකව iv. මිනිසුන්ට/ අවංකව

29. අටවන දේව පනතින් නියමවන්නේ,

i. ජීවිත විනාශ නොකළ යුතු බවයි
ii. සත්‍යවාදීව හා සත්‍යයට සාක්ෂි දැරීමේ අවශ්‍යතාවයි
iii. කාම මිථ්‍යාචාරය නොකළ යුතු බවයි
iv. අන් වස්තු ආශා නොකළ යුතු බවයි

30. ඒ දිව්‍ය පූජාව තුළ ජොහන් සුබාරංචිය භාවිතා කරනු ලබන්නේ,

i. චතාරි හා පාස්කු සමයේදී ii. නත්තල් සමයේදී
iii. ආගමන සමයේදී ය. iv. නත්තල් හා පාස්කු සමයේදී ය.

31. ශුද්ධ වූ දින තුන ලෙස හඳුන්වනු ලබන්නේ,

i. මහා බ්‍රහස්පතින්දා / මහා සිකුරාදා /ආලේලුයියා සෙනසුරාදා
ii. ගොබ් ඉරිදා/ මහා බ්‍රහස්පතින්දා/ මහා සිකුරාදා
iii. මහා සිකුරාදා/ ගොබ් ඉරිදා/ පාස්කු ඉරිදා
iv. ගොබ් ඉරිදා/ මහා සිකුරාදා/ පාස්කු ඉරිදා

32. නත්තල් සමය තුළ සමරන වැදගත් මංගල්‍යයක් වන්නේ,

i. පරිශුද්ධ දේව මාතා මංගල්‍යය. ii. සියලු සාන්තුවරයන්ගේ මංගල්‍යය.
iii. දේව මාතාවන් පරලොවට වැඩීමේ මංගල්‍යය. iv. ශුද්ධ වූ පවුලේ මංගල්‍යය.

33. උත්ථාන සමය හා චතාරික සමයේ භාවිතා වන වර්ණ වන්නේ,

i. සුදු හා රතු ii. රතු හා කොළ iii. සුදු හා දම් iv. රතු හා දම්

34. දිව්‍ය පූජාවේ ප්‍රධානතම යාච්ඤාව වන්නේ,

i. ස්තෝත්‍ර යාගික යැදුම ii. විශ්වාසකයින්ගේ යැදුම
iii. පොදු යැදුම iv. පශ්චාත්තාපික යැදුම

35. "මැරෙන තරමට මාගේ සිත අතිශයින් ශෝකාකුලය. මෙහි නැවතී අවදිව සිටින්න" මෙය කා විසින් කාහට කියන ලද්දක් ද?

i මරිය තුමිය විසින් ශ්‍රාවකයන් ට ii.ශතාධිපතියා විසින් ජේසුස් වහන්සේ ට
iii.ජේසුස් වහන්සේ විසින් ශ්‍රාවකයන් ට iv.ජේසුස් වහන්සේ විසින් පියාණන් වහන්සේ ට

36. උත්තම පූජක යාච්ඤාව පුරා දිව යන ප්‍රධාන තේමාව වන්නේ,

i. ප්‍රේමය යි. ii. දයානුකම්පාව යි. iii. විශ්වාසය යි. iv. එකමුතුකම යි.

37. ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දරණ ක්‍රිස්තු අනුගාමිකයන් වන අප සැමගේ වගකීම වන්නේ,

i. කතෝලිකයන් තුළ බලාපොරොත්තු ඇති කිරීම යි.
ii. කතෝලිකයන් තුළ විශ්වාසය ඇති කිරීම යි.
iii. කතෝලික සභාව ආරක්ෂා කිරීම යි.
iv. එකම කතෝලික සභාවක් ස්ථාපිත කිරීම යි.

38. ලංකා සභාව හඳුන්වන වෙනත් නම්,

i. ඇංග්ලිකන් සභාව/ බැප්ටිස්ට් සභාව ii. එංගලන්ත සභාව/ ඇංග්ලිකන් සභාව
iii. බැප්ටිස්ට් සභාව/ මෙතෝදිස්ත සභාව iv. එංගලන්ත සභාව/ ප්‍රෙස්බිටේරියන් සභාව

39. පඬුරු පෙරහැරේ රැගෙන එන පඬුරු වලින් පූජාසන මත තබන පඬුරු වන්නේ,

i. මල්/සුවඳ දුම් ii. පහන්/ පූප iii පූප/මිදියුෂ iv. එළවළු/පහන්

40. <u>සාලෙම්</u> නුවර පූජක රජතුමකු වූ මෙල්කිසෙදෙක් ප්‍රථම වරට පූප හා මිදියුෂ ගෙන දෙවියන් වහන්සේට ඔප්පු කළේය. මෙහි ඉරි ඇඳි පදයෙහි තේරුම වන්නේ,

i. ගලීලය ii. ජෙරුසලම iii. යුදයාව iv. බෙත්ලෙහෙම

8756

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

7.11.2016

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 2 |

- පළමුවන ප්‍රශ්නයට හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක්ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 යි.

1. i. දේව අනාවරණයේ ප්‍රධාන මූලාශ්‍ර දෙක නම් කරන්න.

ii. ශුද්ධ වූ පාවුලු තුමා ලිපි (හසුන්) ලිවීමේ පරමාර්ථ දෙක ලියන්න.

iii. ශුද්ධ වූ පේදුරුතුමාගේ ''මහා ප්‍රකාශනය'' ලියන්න.

iv. ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගේ අවසාන ඔවදන ලියන්න.

v. අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේදී ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.

vi. ඉශ්‍රායෙලයේ පූජා වර්ග බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක ලියන්න.

vii. දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු දෙකක් ලියන්න.

viii. උත්තම පූජක යාච්ඤාවේ ප්‍රධාන කොටස් දෙකක් ලියන්න.

ix. දිව්‍ය පූජාවේ දී දක්නට ලැබෙන මුලසුනේ යැදුම් දෙකක් ලියන්න.

x. නික්මයාම පොතේ (20 : 17) සඳහන් වන ආකාරයට නවවන දේව පතුත නම් කරන්න.

(ලකුණු 2x10 = 20)

2. i. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද දෙකක් ලියන්න.

ii. ප්‍රඥා සාහිත්‍යයේ ප්‍රධාන අරමුණ ලියා දක්වන්න.

iii. ඔබේ ජීවිතය තුළ ප්‍රඥාවන්තව කටයුතු කළ අවස්ථා පහක් විස්තර කරන්න.

3. i. ජේසුස් වහන්සේ පේදුරු තුමාට ශුද්ධ වූ සභාවේ නායකත්වය පවරමින් ප්‍රකාශ කළ වචන මොනවාද?

ii. ජේසුස් වහන්සේ පේදුරු තුමාට පැවරූ තුන් ප්‍රකාර කාර්යභාරය ලියන්න.

iii. ඔබට පාසලේ ශිෂ්‍ය නායක තනතුරක් ලැබුනහොත් පේදුරු තුමාගේ ජීවිතය ආදර්ශයට ගනිමින් සැබෑ කිතුනු නායකයකු ලෙස කටයුතු කිරීමේදී අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග පහක් ලියන්න.

4. i දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් දෙකක් ලියන්න.

ii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු තුනක් ලියන්න.

iii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ගෞරව දැක්වීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් පහක් විස්තර කරන්න.

5. i නික්මයාම, පොතේ (20 : 12 වගන්තියට අනුව හතරවන දේව පණත ලියන්න.

ii. ශුද්ධ වූ පාවුලු තුමා එපීස ලිපියේ දෙමාපියන්ට දෙන ලද අවවාදය ලියන්න.

iii. ඔබ වෙනුවෙන් ජීවිතය දානය කරන දෙමාපියන් වෙත ඔබ විසින් ඉටු කළ යුතු වගකීම් පහක් ලියා විස්තර කරන්න.

6. i. ජන වන්දනාවේ ප්‍රධාන අංග දෙකක් ලියන්න.

ii. ජන වන්දනාව පිළිබඳ ව්‍යවස්ථාවේ අංක 07 අනුව ජනවන්දනාව අර්ථ දක්වන්න.

iii. ඔබ මීසම තුළ ජන වන්දනා මෙහෙයන් අර්ථවත් කර ගැනීමට ඔබට ගත හැකි ක්‍රියා මාර්ග පහක් විස්තර කරන්න.

7. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරා ගෙන එකකට පේළි 12ක්ට නොඅඩු වනසේ කෙටි සටහන් ලියන්න.

i. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත
ii. ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා
iii. ශුද්ධ වූ මරිය ගොරෙත්ති තුමිය
iv. පාස්කු සමය